**පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 - 2024**

**-----------------------------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවල අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 13 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 13 හි තත්ත්වාගණනය කළ මතයන් ප්‍රකාශ කර ඇති අතර මේ සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන බැංකුව ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 13 ක් විසින් එපරිදි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති ආකෘතියට අනුව ගිණුම් වාර්තා සකස් කරන බව. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 මඟින් දක්වා ඇති පරිදි මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සමග පසුගිය තොරතුරු කාලච්ඡේදයේ සංසන්දනාත්මකව හෙළිදරව් කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 12 ක් විසින් එපරිදි යෝග්‍ය ආකෘති අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති ආකෘතියට අනුව ගිණුම් වාර්තා සකස් කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සමග පසුගිය තොරතුරු කාලච්ඡේදයේ සන්දනාත්මකව හෙළිදරව් කළ යුතුය. |

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි දක්වා ඇති පිරිවැය හඳුනා ගැනීමේ නිර්නායක සැලකිල්ලට ගෙන දේපල පිරියත හා උපකරණවල පිරිවැය වැඩිවීම හඳුනා ගත යුතු වුවත්, රු.2,209,640 ක් වටිනා වත්කම් අත්පත් කර ගැනීම ජංගම නොවන වත්කම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි අවශ්‍යතාවය අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 03 ක ස්ථාවර තැන්පත් පොළී ආදායම රු.85,864 ක් හා කාරක සභා 02 ක ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළී ආදායම රු.95,841 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතු අතර නිවැරදි අගය ගැලපිය යුතුය. |
| (ඇ) | මනම්පිටිය කාරක සභාවේ සමාලෝචිත වර්ෂයට අදාළව ස්ථාවර තැන්පත් පොළී ප්‍රතිශතයන් වෙනස්වීම මත සමාලෝචිත වර්ෂයට අදාළ පොළී ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි. | ශේෂ සහතික මත පොළී ගැලපීම් කර ඇති බව. | -එම- |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි අවශ්‍යතාවය සලකා තොග සම්බන්ධ සියලුම අලාභයන් සිදුවන කාලච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගත යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 04 ක කල් ඉකුත් වී තිබූ පිරිවැය රු.946,746 ක් වූ තොග සම්බන්ධයෙන් එපරිදි ගිණුම්ගත කර නොතිබුණි. | තොග කපාහැරීමට අනුමැතිය ලැබී නොමැති නිසා ජංගම වත්කම් යටතේ දක්වා ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අයකර ගත යුතු වූ ණය සම්බන්ධයෙන් බොල් හා අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කළයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 13 ක දීර්ඝ කාලීනව අය නොවන රු.364,054,848 ක ණය සම්බන්ධයෙන් බොල් හා අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අයකර ගත යුතු වූ ණය සම්බන්ධයෙන් බොල් හා අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කළ යුතුය. |
| (ඊ) | නවනගරය ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ මිල දී ගෙන තිබූ රු.650,000 ක් වටිනා පරිගණක 02 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය | 2025 වර්ෂයේ නිවැරදි කරන බව. | කමිටුවේ මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන සියළු වත්කම්වලට අදාළ ක්ෂය ගණනය කර |

| | | | |
|---|---|---|---|
| | නොකිරීමෙන් වර්ෂයේ අතිරික්තය රු.65,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුයි. |
| (උ) | බකමූණ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ කමිටුවේ සහ ගොවිජන බැංකු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයන් පරීක්ෂා කිරීමේදී කමිටුවේ ගිණුමට අනුව බැංකුවෙන් ලැබිය යුතු අගය ලෙස රු.853,220 ක්ද බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයනයට අනුව කමිටුවට ගෙවිය යුතු අගය ලෙස රු.1,234,981 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ගිණුම් දෙක අතර රු.381,761 ක වෙනසක් විය. | ඉදිරියේදි නිවැරදි කරන බව. | ගිණුම් අතර සැසඳීම් කර වෙනස හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුයි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දී මනම්පිටිය ගොවිජන සේවා කාරක සභාවේ බිත්තර වී ගබඩාව අලුත්වැඩියා කිරීම සඳහා දරන ලද රු.1,718,633 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2025 වර්ෂයේදි නිවැරදි කරන බව. | ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු අතර, නිවැරදි කිරීමට අදාළ ගැලපීම් කළ යුතුය. |

**1.3.3 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් විකුණා මුදල් ගෙවීමේ පදනම මත ණයට නිකුත් කරනු ලබන, ද්‍රව්‍ය ණය වටිනාකම රු.50,000 සීමාව ඉක්මවිය හැක්කේ වසම් එකකට වඩා වැඩ බලන නිලධාරින් සඳහා පමණක් වුවත්, 2024 වර්ෂයේ විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාදුන් ණය සම්බන්ධයෙන් සීමාව ඉක්මවා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරින් 20 දෙනෙකු විසින් එකතුව රු.12,674,925 ක ණය ලබා දී තිබුණි. | රු.50,000 සිමාව තුළ ණය නිකුත් කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, සීමා ඉක්මවා ණය ලබා දුන් පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය |
| (ආ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව විසින් කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරීන් සහ ගොවි සංවිධාන වෙත 2024 වර්ෂය තුළ රු.57,367,094 ක වටිනාකමකින් යුතු පොහොර පොළී රහිත ණය පදනම මත නිකුත් කර තිබුණු අතර, මෙම ණය නිකුත් කිරීම් සම්බන්ධයෙන් අනුමැතිය ලබාගත් කිසිදු ලේඛනයක් විගණනයට වෙත ඉදිරිපත් නොවුණි. | මධ්‍යස්ථාන ගබඩාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන නිසා ගොවි සංවිධාන වෙත ලබා දි ඇති බව. | -එම- |
| (ඇ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/5/9-05 (මෙහෙ.පො) i වෙළුම හා 2022 නොවැම්බර් 22 දිනැති ලිපිය අනුව ගොවිජන | පොළොන්නරුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය මඟින් | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුමැතියෙන් |

| | | | |
|---|---|---|---|
| | සේවා කාරක සභාවල මුදල් බල ප්‍රදේශයේ හෝ දිස්ත්‍රික් කාර්යාලවල පරිහරණය සඳහා යෙදවීමේදී ගොවිජන සේවා කමිටුවේ අනුමැතිය, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි හා ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ නිර්දේශය සහිතව ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, මනම්පිටිය ගොවිජන සේවා කාරක සභාව විසින් 2024 මාර්තු 21 දිනැති අංක 2024/ක/99 දරන වවුචරය මඟින් ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් නිල නිවාසය අලුත්වැඩියාව සඳහා රු.2,000,000 ක් එපරිදි අනුමැතියක් ලබා නොගෙන ගෙවා තිබුණි. | ඊට අදාළ කටයුතු සිදු කළ බව දක්වා ඇත. | තොරව ගණුදෙනු සිදු කළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඇ) | අඹගස්වැව ගොවිජන සේවා කාරක සාභාව විසින් 2024 වර්ෂය තුළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 06 දෙනෙකු සඳහා රු.13,826,550 ක වාණිජ පොහොර නිකුත් කර තිබූ අතර, මෙම ණයට නිකුත් කිරීම් සම්බන්ධයෙන් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුණි. | සහනාධාර මිලක් යටතේ කෙටි කාලයක් තුළ ගොවීන්ට ලබා දිය යුතු බැවින් සහ දැනට මෙම මුදල් අය වී ඇති බව. | ණයට නිකුත් කිරීම් සම්බන්ධයෙන් විධිමත් අනුමැතියක් ලබා ගත යුතු අතර, අනුමැතියෙන් තොරව ණය ලබා දුන් පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |

**1.3.4 අවිනිශ්චිත ගිණුම්**

| විෂය | මුදල රු. | අවිනිශ්චිත ලෙස තිබූ කාලය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| බකමූණ ගොවි බැංකුවේ ගිණුමේ ශේෂ 02 ක් | 462,783 | 2011 සහ 2017 වර්ෂවල සිට | ඉදිරියේදී නිරවුල් කරන බව. | විධිමත් පරීක්ෂාවක් කර නිරවුල් කළ යුතුය. |

**1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 04 ක වර්ෂ අවසානයේ නිරවුල් නොකළ ණයහිමි ශේෂ | 93,858,972 | ශේෂ සනාථන ලිපි | දිගින් දිගටම පැවත එන ශේෂ බැවින් ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් ලෙස ශේෂ සනාථ කර ගැනීමකින් පසුව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මැදිරිගිරිය 90, කහඹිලියාව වසමෙහි කෘෂිකර්ම පර්යේෂණ | 6,142,000 | ඉතිරි තොග සත්‍යාපනය සඳහා ගබඩාව වෙත ප්‍රවේශ | කෘ.ප.නි.ස නිළධාරින්ගේ අධීක්ෂණය යටතේ ගොවි සංවිධාන වෙත | ණය ලබා දුන් ගොවීන්ගේ නම් ඇතුළත් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | නිෂ්පාදන සහකාර වෙත නිකුත් කර තිබූ පොහොර තොග | | වීමට විගණනයට සීමා කිරීම, ණය පදනමින් ගොවීන් වෙත පොහොර නිකුත් කිරීම සම්බන්ධයෙන් වූ ලේඛන | ලබා දී ඇති බවත්, යම්කිසි සීමාවක් ගොවි සංවිධාන නිළධාරින් විසින් සිදු කර ඇති බැවින් කනගාටුව ප්‍රකාශ කරන බව. | |
| (ඇ) | මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවේ දීර්ඝකාලීනව නිරවුල් නොවූ චක්‍රීය අරමුදල් හා පොළී | 1,954,173 | ශේෂ සනාථන | ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැනුවත් කරන බව. | ශේෂ සනාථ කිරීම් විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | හිඟුරක්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ දැක්වෙන මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාව වෙත ණය පදනම මත විකුණා ඇති කෘෂි රසායනික තොගය | 1,320,500 | විධිමත් ලෙස සැකසූ ණය බිල්පත් සහ ශේෂ සනාථන ලිපි | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | අඹගස්වැව ගොවිජන සේවා කාරක සභාවේ 97 - වෙඩිකච්චිය වසමේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරයා විසින් ණය පදනමින් ගොවින් වෙත ලබා දී ඇති පොහොර තොග | 2,419,956 | ණයට විකුණුම් සම්බන්ධයෙන් ලේඛන | තොග විකුණුම් සම්බන්ධයෙන් ගොවි සංවිධාන වෙතින් වාර්තාවක් ලබා ගත් බවත් සියලු ණය මුදල් පියවා ඇති බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අදාළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

**1.3.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) | මුදල් රෙගුලාසි 103 (1) | මනම්පිටිය ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයෙහි දක්වා තිබූ 2007 වර්ෂයේදී හඳුනාගත් රු.67,832 ක තොග ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | 2024 අප්‍රේල් 24 දිනැති ලිපිය මගින් ගොවිජන සංවර්ධන කොමාරිස් ජනරාල්ගෙන් අවශ්‍ය කටයුතු සඳහා තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ පියවර ගතයුතුය. |
| | (ii) | මුදල් රෙගුලාසි 133,134(3) | ගොවිජන සේවා කාරක සභා 11 ක් විසින් මුදල් හා ගනුදෙනු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදි සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුය. |
| | (iii) | මුදල් රෙගුලාසි 237(අ) | ගබඩා සැපයුම සඳහා ගෙවීම් සිදු කිරීමේදී භාණ්ඩ ලැබී ඇති බවට ද අදාළ බඩු ලේඛණයේ හා තොග පොත් යනාදියේ එකී භාණ්ඩ ඇතුළත්කර ඇති බවට ද සහතිකයක් ඇමිණිය යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 05 ක් විසින් එසේ සටහන් කර නොතිබුණි. | ඉදිරියේදි සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| | (iv) | මුදල් රෙගුලාසි 315 | ගොවිජන සේවා කාරක සභා 13 ක් විසින් මාර්ගස්ථ මුදල් පිළිබඳව රක්ෂණයක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදි සලකා බලන බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (v) | මුදල් රෙගුලාසි 341 | උප පත්‍රිකා පොත් ලැබීම්, නිකුත් කිරීම් සහ ආපසු භාර ගැනීම් නිසි පරිදි සිදුකළ යුතු වූවත්, ගොවිජන සේවා කාරක සභා 3 ක 2024 වර්ෂයේ නිකුත් කරන ලද උප පත්‍රිකා පොත් 29 ක් සම්බන්ධව විස්තර දක්වා නොතිබුණි. | ඉදිරියේදි සිදු කරන බව. | -එම- |
| (vi) | මුදල් රෙගුලාසි 502 (2) | ගොවිජන සේවා කාරක සභා 06 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛණය විධිමත්ව පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදි සිදු කරන බව. | -එම- |
| (vii) | මුදල් රෙගුලාසි 751 | ආයතන සතු භාණ්ඩ තොග විධිමත් ලේඛනයකට ඇතුළත් කළ යුතු නමුත් මැදිරිගිරිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ තොග පොත්වලට ඇතුළත් නොවූ අයිතම 25 කට අයත් තොග ශේෂයන් පැවතුණි. | විධිමත්ව ලේඛනයන්ට ඇතුළත් කරන බව. | -එම- |
| (vii) | මුදල් රෙගුලාසි 880 හා 881 | මුදල් හෝ තොග සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා බලය ලබාදී ඇති සියළුම සේවකයින් විසින් ඇප තැබිය යුතු වුවද, ගොවිජන සේවා කාරක සභා 10 ක නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. | ඉදිරියේදි ඇප තැබීම සිදු කරන බව. | -එම- |
| **(ආ)** | 2023 අප්‍රේල් 24 දිනැති අංක 01/2023 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | | | |
| (i) | 2.1.2 ඡේදය | ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ වාර්ෂික අවසන් ගිණුම් වාර්තාව අනුව ශුද්ධ උපලබ්ධි ලාභයෙන් සියයට 10 ක් ණය අවදානම් සඳහා ගොවි ආපදා ණය ආවරණ ගිණුමට වෙන් කිරීම වාර්ෂිකව සිදුකළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 13 ක ගොවි බැංකු විසින් එවැනි වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | ඉදිරියේදි සිදු කරන බව. | -එම- |
| (ii) | 2.1.2 ඡේදය | එක් එක් ගොවීන් වෙත ණය නිකුත් කරනු ලබන අවස්ථාවේදීම එම ණය මුදල සඳහා ගොවි බැංකු (නියමු) ව්‍යාපෘතියේ දායකත්වය වශයෙන් සියලුම කෘෂි ණය සඳහා ණය | ඉදිරියේදි සිදු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වටිනාකමින් සියයට 1 ක් හා අනෙකුත් ණය සඳහා චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි ප්‍රතිශතයක් ගොවි ආපදා ණය ආවරණ ගිණුමට වෙන් කළ යුතු වුවත්, ගොවිජන සේවා මධ්‍යස්ථාන 13 ක් විසින් එවැනි මුදල් වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | | |
| (ඇ) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ | | | | |
| (i) | 1986 පෙබරවාරි 05 දිනැති අංක 0317 දරන චක්‍රලේඛ ලිපිය | ස්ථාවර තැන්පතු මාරු කිරීමට පෙර ඒ සඳහා කාරක සභා අනුමැතිය ලබාගෙන ගොවිජන සේවා කොමසාරිස් වෙත ද වාර්තා කළ යුතු වුවත්, ලක්ෂ 20 ක ස්ථාවර තැම්පතු මාරු කිරිම සම්බන්ධයෙන් සේවාගම ගොවිජන සේවා කාරක සභාව විසින් එසේ කළ බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | කාරක සභාවේ අනුමැතිය මඟින් මාරුකිරීම් සිදුකළ බව | -එම- |
| (ii) | 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2006/08 දරන චක්‍රලේඛය | කල් ඉකුත් වූ හා අළෙවි කළ නොහැකිව ඉතිරි වී ඇති තොග භාණ්ඩ මුදල් රෙගුලාසි ප්‍රකාරව ලියාහැරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වුවද ගිරිතලේ ගොවිජන සේවා කාරක සභාව විසින් පෙර වර්ෂවලදී විනාශ වී හා කල්පසු වී තිබූ රු.208,566 ක් වටිනා තොග සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | තොග කපාහැරීමට තීරණය කර ඇති බව. | -එම- |
| (iii) | 2023 අගෝස්තු 23 දිනැති අංක 09/2015 දරන චක්‍රලේඛය | කාමර කුලී වර්ග අඩි ප්‍රමාණ අනුව අයකර ගත යුතු වුවත්, මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවට අයත් හෙළ බොජුන්හල සඳහා එම පදනමින් පරිභාහිරව කාමර කුලී අයකර තිබුණි. ඒ අනුව වර්ග අඩි පදනම මත නිවැරදි කුලී ආදායම රු.216,000 ක් වුවද, කුලී ආදායම ලෙස රු.18,000 ක් අය කර තිබීම හේතුවෙන් වාර්ෂික ආදායම රු.198,000 ක් අහිමි වී තිබුණි. | ප්‍රදේශයේ ගොවි පවුල් වල කාන්තාවන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් කාරක සභා හා එක්ව ක්‍රියාත්මක කරන ලද වැඩසටහනක් බව. | උපදෙස් පරිදි කටයුතු කළ යුතු අතර, ව්‍යාපෘති ය සඳහා අනුමැති ය ලබා ගත යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.21,812,705 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.36,771,380 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,958,675 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සහනාධාර පොහොර ආදායම් අඩුවීම, ස්ථාවර තැන්පත් පොලී ආදායම අඩුවීම, පොහොර පරිහරණ වියදම් ප්‍රතිපූර්ණය අඩුවීම, කෘෂි රසායන අලෙවිය අඩුවීම හා වැටුප් හා දීමනා වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැලිකන්ද ගොවිජන සේවා කාරක සභාවේ 2024 මැයි 05 දින කල් පිරීමට නියමිතව තිබූ වටිනාකම රු.5,000,000 ක ස්ථිර තැන්පතු ගිණුම් 04 ක් කල්පිරීමට පෙර 2024 පෙබරවාරි 08 දින මුදල් කරගැනීම හේතුවෙන් කාරක සභාවට ලැබීමට තිබූ රු.365,508 ක පොළී ආදායමක් අහිමි වී තිබුණි. | ජංගම ගිණුම් හෝ ඉතිරිකිරීමේ ගිණුම්වල ප්‍රමාණවත් ශේෂයක් නොමැති වීම නිසා ඒවා ලබා ගත් බව. | කාරක සභාවට පාඩුවක් නොවන පරිදි කටයුතු කළ යුතු අතර, විධිමත් මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගත යුතුය. |

### 3.2 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැලිකන්ද, සිරිපුර සහ නවනගරය ගොවිජන සේවා මධ්‍යස්ථානයන් විසින් 2022 වර්ෂයේ දී මිල දී ගන්නා ලද ඇඩ්වාන්ස් ඒකක 742 ක් කාරක සභා තීරණයකට අනුව තිරසර ගෙවතු වැඩසටහන සඳහා ගොවීන් අතර නොමිලේ බෙදා දී තිබුණි. එම බෙදා දුන් තොගය ගිණුම්වල ගැනිලි ලෙස සටහන් කර තිබූ අතර, තොගය මිල දී ගැනීමේ දී අවශ්‍යතාවය පිළිබඳ අධ්‍යනය කිරීමකින් තොරව මිල දී ගැනීම හා අලෙවිය මන්දගාමීව සිදුවීම හේතුවෙන් ඉතිරි වූ තොග මෙසේ නොමිලේ බෙදා දීමට තීරණය කර තිබීමෙන් කාරක සභාවන් සඳහා රු.1,288,836 ක පාඩුවක් සිදු වී තිබුණි. | කාරක සභා තීරණයක් මත ගොවීන් දිරි ගැන්වීම සඳහා තිරසාර ගෙවතු වගා වැඩ සටහන් සඳහා ගොවීන් වෙත නොමිලේ බෙදා දී ඇති බව. | විධිමත් පරීක්ෂාවක් කර විකිණීම සඳහා මිල දී ගත් තොග නොමිලේ බෙදා දීම නිසා කාරක සභාවට සිදු වූ පාඩුව අදාළ නිළධාරින්ගෙන් අය කර ගත යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්වරයාගේ අත්සනින් යුතුව අංක 20/01/01/පොදු හා 2024 ජූනි 25 දිනැති ලිපිය | ඉදිරියේදි මෙවැනි වියදම් දැරීම සම්බන්ධයෙන් සීමාවන්ට යටත්ව සිදු | ගොවිජන සේවා කාරක සභාවේ මුදල් එවැනි කාර්යයන් සඳහා යොදා |

| | | |
|---|---|---|
| මඟින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ සේවය කළ හිටපු කොමසාරිස් ජනරාල්වරුන් 19 දෙනෙකුගේ ඡායාරූප මුද්‍රණය කිරීම සඳහා මැදිරිගිරිය ගොවිජන සේවා කාරක සභාවෙන් අංක 2024-206 හා 2024 ජූලි 31 දිනැති වවුචරය මඟින් රු.161,500 ක මුදලක් ඵලදායී නොවන කටයුත්තක් සඳහා වැයකර තිබුණි. | කරන බව. | නොගත යුතුය. |

## 3.3 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟුරක්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ 2025 ජනවාරි 01 දිනට ආරම්භක පොහොර තොග භෞතික ශේෂය සහ 2024 දෙසැම්බර් 31 දිනට පොහොර තොග ලේඛනයෙහි තොග ශේෂයෙහි වටිනාකම රු.31,500 ක් වූ ටී.එස්.පී. කිලෝග්‍රෑම් 50 ක පොහොර මිටි 03 ක් සහ වටිනාකම රු.217,684 ක් වූ යූරියා පොහොර මිටි 24.63 ක ඌනතාවයක් පැවතුණි. | තොග භාරව සිටි නිළධාරියා වෙත ගෙවීමට ලිඛිතව දැනුම් දී ඇති අතර මූලික විමර්ෂණයක් කිරීමට කටයුතු සලසා ඇති බව. | විධිමත් පරීක්ෂාවක් කර තොග ඌනතාවයන් අදාළ නිළධාරීන්ගෙන් අයකර ගත යුතුය. |
| (ආ) | හිඟුරක්ගොඩ ගොවිජන සේවා කාරක සභාවේ කෘෂි රසායනික තොග පොත් හා 2024 දෙසැම්බර් 31 දිනට භෞතිකව පැවති තොග ශේෂයන් අතර රු.70,701 ක් වූ පොහොර ඌනතාවයක් විය. | තොග ඌනය පියවීමට ලිඛිතව දැනුම් දී ඇති බව. | තොග ඌනතාවය පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදුකර අදාළ නිළධාරීන්ගෙන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොහොර තොග අවභාවිතා කිරීම හේතුවෙන් ගිරිතලේ ගොවිජන කාරක සභාවේ සේවයේ යෙදී සිටි කම්වු ලිපිකාරිණිය විසින් ගෙවිය යුතු රු.102,024 ක මුදල අය කරගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | අවශ්‍ය කටයුතු කර දෙන ලෙස ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගෙන් ඉල්ලීම් කර ඇති බව. | අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිගුරක්ගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් පිරිවැය රු.1,320,500 ක් වූ කෘෂි රසායනික තොගයක් 2024 දෙසැම්බර් 13 දින මැදිරිගිරිය ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ණය පදනම මත විකුණා ඇති අතර, මේ සම්බන්ධව නිකුත් කළ ණය බිල්පතෙහි භාණ්ඩ නිකුත් කරන්නාගේ සහ භාණ්ඩ ලබා ගන්නාගේ අත්සන් රහිතව අවිධිමත් ලෙස සැකසූ ණය බිල්පත් සඳහා ශේෂ සනාථන ලිපියක් ලබාගෙන නොතිබුණි. | ණයගැති සනාථ ලිපියක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ණය පදනම මත විකුණනු ලබන පොහොර සම්බන්ධයෙන් විධිමත් ලේඛනයක් නඩත්තු කිරීමත්, ශේෂ සනාථ කිරීම් ලබා ගැනීමත් කළ යුතු අතර, එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ආ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වත්කම් යටතේ දක්වා ඇති සේවාගම ගොවිජන සේවා කාරක සභාව සතු ජංගම ගිණුමෙහි ශේෂය රු.151,316 ක් ලෙස දක්වා තිබුණ ද බැංකු ශේෂ සනාථ කිරීමට අනුව ශේෂය රු.2.16 ක් ලෙස දක්වා තිබුණි. | 2008 වසරේ සිට පවතින මෙම ශේෂ වෙනස නිරවුල් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | මෙම නොසැසඳීම් සම්බන්ධයෙන් පරීක්ෂා කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ''සෞභාග්‍යයේ දැක්ම'' පරිසර හිතකාමී කෘෂිකාර්මික වැඩසටහන යටතේ කාබනික පොහොර නිෂ්පාදනය දිරිගැන්වීම උදෙසා උතුරුමැද පළාත් සභාව විසින් 2022 වර්ෂයේ දී වැලිකන්ද ගොවිජන සේවා කාරක සභාව වෙත ප්‍රදානය කරන ලද කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදා ගනු ලබන අමුද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍රය ක්‍රියාත්මක තත්ත්වයට ගෙන ඒමට හැකියාවක් නොපැවතීම හේතුවෙන් වර්ෂ 02 ක කාලයක සිට නිෂ්කාර්යව පැවති අතර, එය පූර්ණ උපයෝජිත තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | පොල් සංවර්ධන මණ්ඩලයේ නම් කරන ලද පුද්ගලයෙකුට ලබා දීම සඳහා කටයුතු යොදා ඇති බව. | වත්කම් පූර්ණ උපයෝජිත තත්ත්වයට පත්කිරීමට අවශ්‍ය කටයුතු සැලසිය යුතුයි. |
| (ආ) | කන්නවල ඇති අවශ්‍යතාවයට අනුව පොහොර හා රසායනික ද්‍රව්‍ය මිල දී ගැනීම හා අනවශ්‍ය ලෙස තොග රඳවා ගැනීම පාලනය | මේ සඳහා මුදල් ගෙවීමක් සිදු කර නොමැති අතර එක් එක් කන්නයේ දී | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන මිල දී ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කළ යුතු වුව ද, වැලිකන්ද ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ 2024 ජනවාරි 01 දිනට පැවති MOP පොහොර පිරිවැය රු.3,002,920 ක් වූ කිලෝ ග්‍රෑම් 404.8 ක තොගය 2024 දෙසැම්බර් 31 දිනවන විටත් ඉතිරිව පැවතුණි. | අලෙවි කරනු ලබන පොහොර ප්‍රමාණයට අදළව සමාගම් වෙත ප්‍රතිපූර්ණය කරන බව. | |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 4 ක් විසින් ඉල්ලීමකින් තොරව දිස්ත්‍රික් ගොවිජන සේවා කාර්යාලය මඟින් ලබා දී තිබූ වටිනාකම රු.776,164 ක් වූ Impact printers 03 ක් සහ Metrix pass book printers 04 ක් වර්ෂය අවසාන වන විට නිෂ්කාර්යව තිබුණි. | අතින් ලියන ලද පාස් පොත භාවිතා කරන බව. | අවශ්‍යතා හඳුනා ගෙන මිල දී ගැනීම් සිදුකළ යුතු අතර ලබා දී ඇති උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | බකමූණ ගොවිජන සේවා කාරක සභාව විසින් නවනගරය ගොවිජන සේවා කාරක සභාව වෙත ලබා දී ඇති වටිනාකම රු.876,318 ක් වූ ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි. | ට්‍රැක්ටර් රථය වෙන්දේසි කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ප්‍රධාන කාර්යලය වෙත යොමු කර ඇත. | සම්පත් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ඉ) | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස්ගේ 2004 සැප්තැම්බර් 13 දිනැති අංක පො/3/ආ/2 “පස් පර්යේෂණ” දරන ලිපියෙහි අවශ්‍යතාවය සලකා නව පස් පර්යේෂණාගාරයක් ආරම්භ කිරීම සඳහා රු.486,018 ක් වැය කර 2005 ජුලි 04 දින ගිරිතලේ ගොවිජන සේවා කාරක සභාව විසින් මිල දී ගෙන තිබූ පස් පර්යේෂණ කටයුතු සඳහා යොදාගනු ලබන උපකරණ අයිතම 30 ක් අපේක්ෂිත පරිදි ගොවීන් හට සේවා සැලසීම සඳහා යොදාගෙන නොතිබුණි. | 2025 ජුලි 29 දිනැති ලිපිය මගින් නිර්දේශ වාර්තාවක් ඉල්ලා ඇති බව. | අපේක්ෂිත පරිදි කඩිනමින් ගොවීන්හට සේවා සැලසීම සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව මිල කැඳවීම්, ප්‍රසම්පාදන කමිටු ඇගයීම්, සැපයුම්කරුවන් තෝරාගැනීම්, සැපයුම්කරුවන් සමග ගිවිසුම්ගතවීම් සිදු නොකර මැදිරිගිරිය, නවනගරය සහ අඹගස්වැව ගොවිජන සේවා කාරක සභා විසින් අලෙවිසැල්වල විකිණීම සඳහා ගෙන එන ද්‍රව්‍ය හා ප්‍රවාහන වියදම් වෙනුවෙන් එකතුව රු.1,829,800 ක් ගෙවා තිබුණි. | පිළිතුරු සපයා නැත. | මිල දී ගැනීම් සඳහා ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කළ යුතු අතර, එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |

## 3.8 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 13 හි ප්‍රාදේශීය නිළධාරි තනතුරු 3 ක් ද කළමනාකරණ සහකාර තනතුරු 09 ක්ද කෘෂිකර්ම පර්යේෂණ සහකාර තනතුරු 120 ක් ද සංවර්ධන නිළධාරි තනතුරු 22 ක් ද මුරකරු තනතුරු 02 ක්ද කම්කරු තනතුරක්ද පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දී ඇති බව. | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍යම පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කළ යුතුය. |

## 4 ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රදේශයේ අනාගත ණය ඉල්ලුම අනුමාන කොට ගොවි ජනතාව දිරිගන්වා නිෂ්පාදන ක්‍රියාවලියට හා විකුණුම් කටයුතුවලට පොළඹවාලීමේ සැලැස්මක් සකස් කොට එම ඉලක්කයට අනුව ඔවුන් ඉතුරුම් හා ණය ක්‍රියාවලියට ඇතුළත්කර ගැනීමේ විභව ගනුදෙනුකරු සැලැස්මක් සකස් කිරීම ණය පාලන කමිටුවේ සහ ගොවිජන සංවර්ධන නිලධාරීගේ වගකීමක් වන බව අංක 04/2012 දරන ගොවි බැංකු චක්‍රලේඛයේ 2.4.1 ඡේදයේ දක්වා තිබුණද ගොවිජන සේවා කාරක සභා 08 ක් විසින් එවැනි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ණය අවශ්‍යතාවය වසම් මට්ටමින් හඳුනාගෙන ඒ අනුව ණය නිකුත් කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව වෙත පියවර ගත යුතුය. |
| (ආ) | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 52(1) වගන්තිය ප්‍රකාරව බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් එවැනි වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. | කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කිරීම සඳහා අවශ්‍ය වගා ඉලක්ක ලබා ගන්නා බව. | පනත ප්‍රකාරව බල ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික වැඩසටහනක් පිළියෙල කළ යුතු අතර, එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |

## 5. පද්ධති හා පාලන

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2012 පෙබරවාරි 29 දිනැති අංක 4/2012 දරන චක්‍රලේඛයේ 3.4.2 (ii) පරිදි නියමිත ණය කාලය දින 180 ඉක්ම වන ලද ගොවීන් 274 දෙනෙකුගෙන් අයවිය යුතු කෘෂිකාර්මික ණය එකතුව රු.101,029,433 ක් 2024 දෙසැම්බර් 31 දින වන විට ගොවිජන සේවා කාරක සභා 11 ක් විසින් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කරගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, කාලීනව ණය අය නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ආ) | වගා ණය සම්බන්ධයෙන් සෑම මාසයක් තුළදීම ණය ලබාදුන් ගොවීන්ගේ නාම ලේඛනයක් ඊළඟ මාසයේ 15 දිනට පෙර දිස්ත්‍රික් සහකාර කොමසාරිස් වෙත යැවිය යුතු බවත්, එහි පිටපතක් මහජන ප්‍රදර්ශනය සඳහා තැබිය යුතු බවත් අංක 04/2012 දරන ගොවි බැංකු චක්‍රලේඛයේ 3.4.9 ඡේදයේ දක්වා තිබුණ ද, ගොවිජන සේවා කාරක සභා 10 ක් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී ඒ අනුව කටයුතු කළ යුතුය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය. |
| (ඇ) | ණය ලබා දුන් දිනයේ සිට මාස 09 ක් එනම්, දින 270 ක් ඇතුළත සියලුම ණය හා පොළී මුදල් අය කළ යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවිජන බැංකුව සතුව මාස 09 ඉක්මවූ ගොවීන් 780 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.54,217,870 ක් වූ වගා ණය හා පොළී මුදල් හිඟව පැවතුණි. | ඉදිරියේ දී ණය අය කරගන්නා බව. | චක්‍රලේඛ ප්‍රකාරව ණය හා පොළී මුදල් අය කිරීමට කටයුතු කළ යුතු අතර, කාලීනව අය කිරීම් නොකළ නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය. |